අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 · +94112785818
info@moe.gov.lk · www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref.

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2026.01.28

# සුබ පැතුම් පණිවුඩය.

ආදරණීය දුවේ පුතේ, දයාබර දෙමාපියනි,

පාසල් යන මුල් ම දවස ආදරණීය දූ දරුවන්ගේ ජීවිතයේ සුන්දර සිහිවටනයක් ලෙසින් සනිටුහන් වනු දැකීම අප පැතුමයි. ඒ අරමුණ මල්ඵල ගන්වනු වස් සතුටින්, විනෝදයෙන් හා අර්ථවත් ව පාසල් සමය නිදහසේ ගත කිරීමට හැකි වන පරිදි පාසල් පරිශ්‍රය හා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායි කිරීමට අපි මහත් පරිශ්‍රමයක් දරන්නෙමු.

ඔබ ඔසවාගෙන ආ යුතු පොත් බෑගයේ බර අඩු කරන්නට අප උත්සුක වන්නේ, ඔබට ලබා ගැනීමට සලස්වන දැනුමේ හා ආකල්පවල මෙන් ම කුසලතාවන්ගේ කිසිදු අඩුවකින් තොර ව ඉතා පරිපූර්ණ ව හා ඉදිරි වැඩ ලෝකයට ගැළපෙන අයුරිනි.

දයාබර දෙමාපියනි, ඔබේ දරුවාට පොහොසත් රටක් තුළ පොහොසත් අධ්‍යාපනයක් ළඟා කර දීම අපේ අරමුණයි. කිසිදු දරුවකුගේ අධ්‍යාපනය තම දෙමාපියන්ගේ ආර්ථිකය මත තීරණය නොවිය යුතු බවත්, කිසිඳු දරුවෙකු අධ්‍යාපනයෙන් පිටමං නොවිය යුතු බවත් අපගේ විශ්වාසයයි. ඒ අනුව සෑම දරුවෙකුට ම සම අධ්‍යාපන අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය සියලු කටයුතු රජයක් වශයෙන් ස්ථාපිත කිරීමේ වගකීම අප භාරගෙන තිබේ. අපගේ ඒ අවංක උත්සාහය මුදුන් පමුණුවාගැනීමට සියලු දෙනාගේ ඵලදායි අදහස්-උදහස් ඉතා වැදගත් කොට සලකමු.

නම්‍යශීලී සුහද පිළිවෙතකින් එම සාධනීය මඟ පෙන්වීම හා අදහස භාරගෙන දුවන-පනින හැදෙන- වැඩෙන ඔබේ දූ දරුවන්ගේ අත්දැකීම් වඩාත් ප්‍රායෝගික හා අරුත්බර කර ගනිමින් පන්ති කාමරයේ සතුටින් රඳවා ගැනීමේ වගකීම අප භාරගෙන තිබේ.

ආදරණීය දුවේ පුතේ, මව් ඇකයෙන් මිදී ගුරු දෙමාපියන් වෙත පා තබන ඔබගේ ඉදිරි අනාගතය සර්ව ප්‍රකාරයෙන් ම සාර්ථක වේවා'යි මම ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය හරිනි අමරසූරිය,
අග්‍රාමාත්‍ය,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය.